# ලංකාවිත්ති
# LANKA VITHTHI

මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුමිය!
Mother and Motherland are nobler than Heaven



FOR FREE CIRCULATION
නොමිලේ බෙදාහැරීම පිණිසයි

VOLUME 15
NUMBER 03

ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

JUNE 2012 ජුනි මාසය (බුද්ධ වර්ෂ 2556 පොසොන් මාසය)

http://www.lankaviththi.org




Photograph - Chathura S. Kodikara චතුර එස්. කොඩිකාර

තො සි න් මියුරු ගාථා කියැවෙන සෙමෙන
අ ස න් දහම් පද බණ මඩුවෙන් දෙසන
පොසොන් පොහෝදින බැතියෙන් සිල් රැගෙන
ප ස න් මගට පිවිසෙමු බව දුක නිවන

**Listening to melodic stanzas chanted in lowered voice,**
**That is coming out of the temple's main sermon hall**
**And on Poson Poya Day observing 'Sil' with devotion**
**Let's be on the right path that ends the suffering of all**

♦ දයා ආනන්ද රණසිංහ ♦ *Daya Ananda Ranasinghe*

# යුරෝපය කඩාවැටේ?

♦ සංජය විමලරත්න විසිනි

**මෙම ලිපියේ අරමුණ අද යූරෝ කලාපයට (Euro Zone) සහ යූරෝ නමැති මුදල් නෝට්ටුව (Euro) කෙරෙහි ක්ෂණිකව බල පාන, එසේම ඒ හේතු වෙන් ශ්‍රී ලංකාවට ද මුහුණදීමට සිදුවිය හැකි යම් අපහසුතා පිළිබඳ විමසුමක් කිරීම ය.**

**සැ**බැවින්ම නුදුරු අනාගතයේදී එසේ සිදුවිය හැකිද යන්න ජාතික හා ජාත්‍යන්තර ජන මාධ්‍යන් ද, ආර්ථික විශේෂඥයින් ද, දේශපාලනඥයින් ද දැන් සැහෙන කාලයක සිට දැඩි සැළකිල්ලක් යොමුකර ඇති කාරණයකි. ප්‍රංශයේ ජනපතිවරණයෙන් බලයේ සිටි සාර්කෝසි ඉවතට විසිවී සමාජවාදී හොලන්ඩේට ජය අත්වීම, ග්‍රීසියේ පැවති මැතිවරණයෙන් දක්ෂිණාංශික රජයක් බලයට ආවේ නමුදු එහි දුර්වලතාව හේතුකොට ගෙන එය ඉතා ඉක්මනින් කඩා වැටී නැවත තවත් මැතිවරණයක් ග්‍රීසියේ පැවැත්වීමට සූදානම්වීම ආදිය පසුගිය සති කීපය තුළ ඇතිවූ සිදුවීම් අතර ප්‍රධාන තැනක් ගනී. ජුනි 17 වන දින ග්‍රීසියේ තවත් අළුත් මැතිවරණයක් පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත. ඉන් ලැබෙන ප්‍රතිඵලය ග්‍රීසියේ අනාගත ආර්ථික ස්ථාවරය කෙරෙහි දැඩි බලපෑමක් ඇතිකරන්නට සමත් වෙන අතරම යූරෝ කලාපයටද ඒ කාරණා වැදගත් වෙයි. මේ සියල්ලෙන් විහිදා දක්වන්නේ දැනට බටහිර පවතින ආර්ථික අස්ථිරත්වයයි. මෙය ජාත්‍යන්තර වශයෙන් දැඩි අවධානයක් යොමු කරන්නට සිදුවී ඇති කරුණකි.

මෙම ලිපියේ අරමුණ යූරෝ කලාපයට සහ යූරෝ මුදල් නෝට්ටුව කෙරෙහි ක්ෂණිකව බලපාන, එසේම ඒ හේතුවෙන් ශ්‍රී ලංකාවට ද මුහුණ දීමට සිදුවිය හැකි කිසියම් අපහසුතා පිළිබඳ විමසුමක් කිරීම ය.

## යුරෝපා සංගමයේ සහ යූරෝ නොට්ටුවේ ඉතිහාසය කෙටියෙන්

දෙවන ලෝක සංග්‍රාමය අවසන් වෙත්ම ඊට මුහුණදුන් යුරෝපයේ සියලු රටවල් මනාව වටහාගත් ප්‍රධානතම කාරණය වූයේ ඒ යුද්ධය ඇතිවීමට මූලික හේතුව ඔවුන්ගේම එනම්, යුරෝපයේ රටවල් වල තිබූ අසමගිකම බවත් ඒ නිසා යුරෝපය සමගි වී සිටීම අත්‍යවශ්‍ය බවත්ය. මේ අනුව බෙල්ජියම, ප්‍රංශය, ජර්මණිය, ඉතාලිය, ලක්සම්බර්ග් සහ නෙදර්ලන්තය යන රටවල් 6 එක්වී 1952 දී යුරෝපා සංගමය නමින් ඒකකයක් පිහිටුවා ගත්හ.

දෙවන ලෝක යුද්ධය අවසන්වීමත් සමග ඇමරිකාව සහ සෝවියට් දේශය ලෝකයේ ප්‍රධාන බලවතුන් දෙදෙනා බවට පත්වීමත් සමග ඔවුන් දෙදෙන අතරේ සීතල යුද්ධය ආරම්භ වූයේය. 1957 දී රුසියාව සුපුට්නික් යානය අභ්‍යාවකාශයට යවමින් අජටාකාශ තරඟයේ ඉදිරියෙන් යද්දී ඒ නිසා උපන් අනියත බියක් නිසාදෝ සෙසු යුරෝපීය රටවල් ද ආර්ථික වශයෙන් තමන් ශක්තිමත් වී සිටීම නුවණට හුරුයයි සිතා ඒ සඳහා සංගමයක් සාදා ගැන්මේ අවශ්‍යතාව දුටහ. මේ අනුව තවත් රටවල්ද එක්වීමෙන් ඒ සමස්ථය යුරෝපීය ආර්ථික සංගමය (European Economic Community හෙවත් EEC) නිර්මාණය කරගත්තේය.

මේ **EEC** සාමාජිකයෝ රෝමයේ දී ගිවිසිමකට අත්සන් තැබූහ. ඒ ගිවිසුමට අනුව ඒ සාමාජික රටවල ජනතාවට ඒ රටවල් අතරේ වීසා නැතිව පහසු ගමනා ගමනය ද, බදුඅයකිරීමෙන් තොරව බඩු ගෙන්වීම සහ ගෙනයාම ද තහංචි නැතිව ඒ ඒ රටවල රැකියාවල යෙදෙන්නට හැකිකම ආදිය ඇතුළු පහසුකම් රැසක් අත්විය.

මේ සියල්ලේ පරමාර්ථය වූයේ යුරෝපීය ජාතීන් එක පොකුරක් ලෙස ලොව කැපී පෙනෙමින් ආර්ථික ශක්තිය අතින් බලවත්වීමය. මෙහි සංවිධායක මධ්‍යස්ථානය ලෙස බ්‍රසල්ස් නුවර නම් කරන ලදී.

සෝවියට් සංගමයේ වැටීමත් සමග මුලින් එම සංගමය සමග සිටි තවත් යුරෝපීය රටවල් රැසක් මෙම අළුත් යුරෝපීය ආර්ථික සංගමයට බැඳුණාහ. එය තවත් ශක්තියක් විය. මෙහිදී යුරෝපීය ආර්ථික සංගමය මගින් එම සමූහයට පොදු මුදල් නෝට්ටුවක්ද යූරෝ නමින් නිකුත් කරන්නට තීරණය කළ අතර, ඒ සංගමයට අයත් රටවල එතෙක් භාවිතා කළ ඒ රටවලට අනන්‍ය වූ ජාතික මුදල් නෝට්ටු ඉවත ලා අළුත් යූරෝ නෝට්ටුව සියළු ගනුදෙණු සඳහා එතැන් පටන් භාවිතා කළ යුතුයයි සම්මත කරගන්නා ලදී.

එසේ වුවද එක්සත් රාජධානිය එම යුරෝපීය සංගමයේ සාමාජිකයෙකු වුවද සිය මුදල් නෝට්ටුව වන ස්ටර්ලිං පවුම අත්හැර යූරෝ නොට්ටුව භාවිතා කරන්නට අකමැති වූවාය. අනෙක් හැම කාරණයකදීම සංගමය හා සිටියත් මුදල් නෝට්ටු භාවිතයේදී පමණක් බ්‍රිතාන්‍යය පුරුදු පවුම සමගම සිටින්නට තීරණය කළාය.

යූරෝ නෝට්ටුව භාවිතා කරන රටවල් සමූහය අඳුන්වන්නේ යූරෝ කලාපය යන වචන දෙකෙනි. යූරෝ කලාපයේ දැන් රටවල් 27 කි තිබේ.

යූරෝ කලාපය වසර 14 කට ඉහත නිර්මාණය කළ දා සිට එමෙන්ම යූරෝ Euro එහි මුදල් ඒකකය වූදා සිට එම රටවල් හැම එකක්ම පාහේ පත්කර ගත්තේ දක්ෂිණාංශික රජයයන්ය. ඒ රට වල් ආර්ථික තත්වයෙන් ස්ථාවර වෙමින් සංගමය යුරෝපයේ ආර්ථික බල ඒකකය වශයෙන් හැඳින්වෙන්නට විය.

2008 දී බටහිර බැංකු පද්ධතිය කඩා වැටෙන්නට පටන්ගත් විටය සෝදා පාලුව ආරම්භ වූයේ. ඇමරිකාවේ හා බ්‍රිතාන්‍යයේ බැංකු ක්‍රමය බිඳ වැටීමෙන් වූ හානිය තවමත් යථා තත්වයට පත්කර ගන්නට බැරිව ඒ රටවල් විඳින අපහසුව අපට දක්නට හැකිය. නමුත් යුරෝපා සංගමයේ බැංකු එසේ කඩා නොවැටී පැවතුණිය. එසේ වූයේ සමහර විට ඒ සංගමය එක ඒකකයක් සේ ඒකාබද්ධව සිටින නිසා විය හැකිය. එසේම ජාත්‍යන්තර බැංකු ක්‍රමයෙන් යූරෝ කලාපයේ රටවලට එතරම් බලපෑමක් නැති නිසාත් විය හැකිය. එසේම යූරෝ කලාපය ජර්මනිය, ඔස්ට්‍රියාව, ප්‍රංශය, ඉතාලිය සහ ස්පාඤ්ඤය වැනි ආර්ථික ස්ථාවරයන් ඇති රටවල් වලින් සමන්විතව ඇති නිසාත් විය හැකිය.

## සෝදා පාලුව ආරම්භ වෙයි.

අවුරුදු තුනකට පෙර පෘතුගාලයේ ආර්ථික ක්‍රියා පිළිවෙල කඩාගෙන වැටුණු අතර එය යථා තත්වයට පමුණුවන්නට යුරෝපා මධ්‍යම බැංකුව මැදිහත් වීමෙන් කඩිනම් පියවරවල් ගැනිණ. පෘතුගාලය එම රටවල් පොකුරේ ඉතාම දුර්වල ආර්ථිකයක් සහිත රට විය. මේ දෙයම ඉතාලියට ද සිදුවිය. ඉතාලිය කලින් ශක්තිමත් ආර්ථිකයක් තිබූ රටකි. මෙහිදීද අවශ්‍ය ප්‍රතිකර්ම යොදා ඉතාලිය ගොඩගනු ලැබිණ. මේ නොබෝදා ආර්ථික කඩා වැටීමේ ඉරණමට මුහුණ පෑයේ ග්‍රීසියයි. එය ගොඩ ගන්නට IMF හෙවත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් මැදිහත්වූ අතර වියදම් කපා හරින ක්‍රම සහ විධි අනුගමනය කරන ලෙස ග්‍රීසියට විධාන කෙරිණ. ග්‍රීසියේ පැවති රජය බැංකුවලින් මුදල් ණයට ගෙන රටේ බොහෝ අවශ්‍ය දේට මෙන්ම අනවශ්‍ය දේටත් අත දිග හැර වියදම් කිරීමෙ හේතුවෙන්

4 වන පිටුවට →


